# දරු ප්‍රසූතිය හා බැඳුණු ඇදහිලි හා ජන විශ්වාස නූතන භාවිතය හා එහි බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

රාජපක්ෂ පී.එන්. සහ මධුෂාණි ඩබ්ලිව්. ඒ.ඩී.වී.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය
nimesharj@gmail.com

**සාරසංක්ෂේපය**

කාන්තාවකගේ දිවියේ සුවිශේෂි කාල පරිච්ඡේදයක් ලෙසට ගර්භනී සමය පෙන්වාදිය හැකිය. ගර්භනී කාන්තාවකගේ දරු ප්‍රසූතිය යනු ඉතා බැරෑරුම් හා අනතුරුදායක අවස්ථාවකි. එම නිසාවෙන් අතීතයේ දරු ප්‍රසූතිය හා බැඳුණු ඇදහිලි හා ජන විශ්වාසයන් රැසක් පැවතුණි. දරු ප්‍රසූතිය හා බැඳුණු ඇදහිලි හා ජන විශ්වාසයන් මොනවාද යන්න හදුනාගැනීම මෙහි අරමුණ වේ. එම ඇදහිලි හා ජන විශ්වාසයන් තුළින් අවිහිංසාව, මානුෂීය බව, මනෝවිද්‍යාත්මක පසුබිම හා ප්‍රායෝගික බවක් කෙතරම් දුරට පවතීද හා වර්තමානයට මෙම ඇදහිලි හා ජන විශ්වාසයන් යොදාගත හැකිද යන්න මෙහි පර්යේෂණ ගැටලුවේ. නොච්චියාගම ප්‍රදේශය ආශ්‍රිතව සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ක්ෂේත්‍ර නොවෙන අධ්‍යයනය යටතේ ද්විතියික මූලාශ්‍රය යොදාගෙන දත්ත රැස්කරන ලදී. දරුවා ලැබීමට ආසන්න වන විට "වැඳුම්ගෙය" සකසා ගනියි. ගැබිනිය නිවසේ සිටින අවස්ථාවේදී වැඳුම්ගෙය පිළිසකර කටයුතු ආරම්භ කිරීම පිළිවෙත නොවේ. ඇය පන්සලට හෝ දිය නෑමට ගිය අවස්ථාවක් මේ සදහා තෝරාගනු ලබන්නේ ගැබිනියගේ සිතට බලපෑමක් ඇතිවන ආකාරයක් එකි කටයුතු ආරම්භ කිරීම මනෝවිද්‍යාත්මකව අනුචිතය යන විශ්වාසය මතය. අලුත විවාහපත් කාන්තාවන්ට හෝ වැඩිවිය පත් දැරියන්ට වැඳුම්ගෙයි කටයුතුවලට සහභාගිවීම තහංචි වූයේ අනාගතයේදී දරු ප්‍රසූතිය පිළිබඳව අනියත බියක් ඇතිවේය යන මනෝවිද්‍යාත්මක සාධකය මතය. වැඳුම්ගෙය කටයුතු පෝය දිනයක නොකරයි. එම තහංචිය ගොඩනැගී ඇත්තේ පිරිසිදු කිරීමේදී මකුළු බිත්තර, කුඹල් ගෙවල්, හූණු බිත්තර වැනිදේ විනාශ වන බැවිනි. පෝය දිනයක සිදුවන ප්‍රාණඝාතය ගැබිනියගේ ගැබ කෙරෙහි අයහපත්ව බලපාන බැවින් මෙම කටයුත්ත සදහා කෙම්මුර දිනද යොදා නොගනි. මන්ද මෙම දින වල අමනුෂ්‍ය කොට්ඨාසවල බලපෑම වැඩි දින ලෙස සළකනු ලබන බැවිනි. වඳ ස්ත්‍රීන්ට වැඳුම්ගෙයට යාමට හෝ විලි රැහැන ස්පර්ෂ කිරීමට ඉඩනොදේ. වඳ ස්ත්‍රීන් විසින් විල රැහැන ස්පර්ෂ කිරීමෙන් එම රැහැන අල්ලා බිහිකරන දරුවා මියයන විශ්වාසය හේතුවෙනි. එය දරුවන් නොලැබූ කාන්තාවන්ට වන මානසික පීඩනයකි. දරු ප්‍රසූතියකදි මවගේ හිස උතුරු දිශාවට යොමුවන සේ හරවා නොතබයි. උතුරු දිශාවට සම්බන්ධ වූ විවිධ චුම්භක ශක්තීන් වැනි ශක්තීන් පවතින බව නවීන විද්‍යාවේ පිළිගන්නා බැවින් එම ශක්තීන්වල බලපෑමක් දරු ප්‍රසූතියේදි සිදුවිය හැකි බව පැරැන්නන් අතීයේ සිට වටහාගෙන ඇති බව පෙනේ. මෙම පර්යේෂණය තුළින් මෙම ජන විශ්වාසයන් හා ඇදහිලි අතීතයේ සිට කාලීනව යම් යම් වෙනස්කම්වලට ලක් වුවද ඇතැම් ඇදහිලි ගිලිහී ගොස් ඇති බව නිගමනය කල හැකිය.

**ප්‍රමුඛ පදඃ** *දරු ප්‍රසූතිය, වැඳුම්ගෙය, තහංචිය, මනෝවිද්‍යාත්මක පසුබිම, ජන විශ්වාසයන්*